DOI : 10.31357/fhssmst.1998.00678

# ශ්‍රී ලංකාවේ කින්නර ජනතාව පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

# ශ්‍රී ලංකාවේ කින්නර ජනතාව පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

# AN ANTHROPOLOGICAL STUDY OF THE KINNARAS IN SRI LANKA.

මහනුවර හේනාවල (කලාසිරිගම) සහ මාතලේ මල්හැව (ආලෝකගම)

කින්නර ගම්මාන ඇසුරින් කරන ලද අධ්‍යයනයකි

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධි

පරීක්ෂණය සඳහා ඉදිරිපත් කෙරෙන නිබන්ධය.

අධ්‍යයන වර්ෂය : 1998

ලියාපදිංචි අංකය : A -17381

නම : කේ.එම්.එස්.සමරසේකර

සමාජ විද්‍යා සහ මානව විද්‍යා අධ්‍යයනාංශය,

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,

ගංගොඩවිල

නුගේගොඩ.

## කර්තෘගේ සහතිකය

මෙම නිබන්ධයේ ඇතුළත් කරුණු මුළුමනින්ම හෝ කොටසක් හෝ වෙනත් කිසිම පර්යේෂණයක් සඳහා හෝ ප්‍රකාශනයක් වශයෙන් හෝ ඉදිරිපත් කර නොමැත. නිබන්ධය සැකසීමේදී යොදාගත් මූලාශ්‍රය සහ වෙනත් භාවිතයන් සහ ආධාරක පිළිබඳ සත්‍ය තොරතුරු මෙහි ඇතුළත් කර ඇති බව සහතික කරමි.

. . . . . . . . . . . . . . . . 

දිනය: 1999.02.10

කේ.එම්.එස්.සමරසේකර,
සමාජ විද්‍යා සහ මානව විද්‍යා අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,
ගංගොඩවිල,
නුගේගොඩ.

පිදුම . . .!

එදා මෙදා තුර

අප වෙනුවෙන්

අනන්ත දුක්විඳි

ආදරණීය

මැණියන්ට

සහ

පියාණන්ට

උපහාරයක් වේවා...!

## ස්තුතිපූජා

කින්නර ජනතාව පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා මා පෙළඹවූ සහ අධ්‍යයනයේ ආරම්භයේ සිට අවසානය දක්වා මග පෙන්වූ මහාචාර්ය නන්දසේන රත්නපාල මැතිතුමාට

මෙම භාරදූර කාර්යය සඳහා නිරතුරුව ශක්තියක් වූ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශ ප්‍රධාන එඩ්වින් ගණිහිගම මහතාට

උපදෙස් අවවාද දෙමින් මා මෙහෙයවූ මහාචාර්ය ජී.එල්.ඩී.වෛද්‍යසේකර සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය බී.ජ්.ටෙනිසන් පෙරේරා මහතුන්ට

සියලු අවස්ථාවලදී ඉදිරියෙන් සිට මා මේ දුර රැගෙන ගිය ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර මහතාට

දින ගණන් නිදි වරාගෙන සැම අතින්ම සහයෝගය ලබාදුන් රත්නායක, සමන්, ඩයස් සහෘදයන්ට

ක්ෂේත්‍ර කටයුතු වලදී සහය දුන් පල්ලියවත්ත ඇතුළු සියලු දෙනාට

පරිගණක කටයුතු වලදී උපකාර කල ශිරෝමි ඇතුළු සැමට

හේනාවල සහ මල්හෑව ගම්වාසීන්ට

මේ වෙනුවෙන් ගෙදර කරදර නැතිව ඉසිලූ රේණුකාට

තත් අයුරින් සහාය දුන් සැමට

මාගේ ගෞරව පූර්වක ප්‍රණාමය පුද කරමි.

## පටුන


පිටු අංක

**පළමුවන පරිච්ඡේදය - හැඳින්වීම.** 1 - 12

1.1 පර්යේෂණය හැඳින්වීම සහ විෂය ක්ෂේත්‍රය 1 - 2

1.2 පර්යේෂණයේ වැදගත්කම 2 - 3

1.3 අධ්‍යයනයේ අරමුණු 3

1.4 පර්යේෂණයේ යොදාගත් මූලාශ්‍රයන් 3 - 4

1.5 පර්යේෂණයේ ක්‍රමවේදය 5 - 9

1.6 පර්යේෂණයේ නියැදිය 9 - 11

1.7 පර්යේෂණයේදී මුහුණ දුන් දුෂ්කරතා 11 - 12

1.8 නිබන්ධයේ පරිච්ඡේද විග්‍රහය 12

**දෙවැනි පරිච්ඡේදය - කින්නර ජනතාව පිළිබඳ මූලික හැඳින්වීමක්** 13 - 43

**2.1 ශ්‍රී ලංකාවේ ජන වර්ග අතර කින්නර ජනතාව** 13 - 36

2.1.1 කින්නරයන් ඇතුළත් සිංහල සමාජය ගොඩනැගුණු ආකාරය 13 - 14

2.1.2 කින්නරයන් සහ අනෙකුත් කුඩා කණ්ඩායම් සිංහල සමාජ තුළ ස්ථාපිතවූ ආකාරය 14 - 23

2.1.3 කින්නර ජනතාවගේ අනන්‍යතාව 23 - 35

2.1.4 කින්නරයන්ගේ අවකාශීය ව්‍යාප්තිය 35 - 36

**2.2 කින්නර ජනතාවගේ ශාරීරික ලක්ෂණ** 37 - 43

2.2.1 කින්නර ශාරීරික ලක්ෂණ පිළිබඳ සංසන්දනාත්මකඅධ්‍යයනයක් 37 - 41

2.2.2 ශාරීරික විවිධත්වය පිළිබඳ සංඛ්‍යාන විද්‍යාත්මක පැහැදිලි කිරීම 41 - 42

**2.3කින්නර සමාජ ,සංස්කෘතික සහ ශාරීරික ලක්ෂණ වල ඇති විශේෂත්වය42 - 43**

**තුන්වන පරිච්ඡේදය - කින්නර ජනතාවගේ සමාජ සංවිධානය සහ ආර්ථිකජීවිතය.** 44 - 60

3.1 කින්නර සමාජ සංවිධානය පවුල සහ ඥාතිත්වය 44 - 51

3.2 කින්නර අර්ථ ක්‍රමය 51 - 60

**හතරවන පරිච්ඡේදය - කින්නර ජනතාවගේ ද්වාර කර්ම චාරිත්‍ර** 61 - 86

4.1 ද්වාර කර්ම අවස්ථා හා ද්වාර කර්ම චාරිත්‍ර 61 - 63

4.2 උපත සම්බන්ධ චාරිත්‍ර 63 - 68

4.3 වැඩිවිය පැමිණීම හා සම්බන්ධ චාරිත්‍ර 68 - 76

4.4 විවාහ චාරිත්‍ර 76 - 82

4.5 අවමංගල්‍ය චාරිත්‍ර 82 - 86

**පස්වන පරිච්ඡේදය - කින්නර ජනතාවගේ ජනශ්‍රැතිය. 87 - 116**

5.1 ජනශ්‍රැතිය පිළිබඳ මානව විද්‍යාත්මක අර්ථ කථනයක් 87 - 88

5.2 කින්නර ජනතාව හා සම්බන්ධ ජනකථා 88 -97

5.3 කින්නර ජනතාව හා සම්බන්ධ ජනකවි 97 -104

5.4 කින්නර ජනතාව හා සම්බන්ධ ජන ශාන්ති කර්ම 104 - 110

5.5 කින්නර ජනතාවගේ ජන ක්‍රීඩා 110

5.6 කින්නර ජනතාවගේ ජන වෙදකම 111 - 112

5.7 කින්නර ජනතාවගේ ආගමික ඇදහිලි විශ්වාස 112 - 116

**හයවන පරිච්ඡේදය - කින්නර ජනතාවගේ සමාජ, සංස්කෘතික වෙනස්වීම. 117 - 132**

**හත්වන පරිච්ඡේදය - සමාලෝචනය 133 - 144**

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 145 - 151**

**උපග්‍රන්ථය-1 152 -153**

**උපග්‍රන්ථය-11 153 -161**

## පළමුවන පරිච්ඡේදය

## හැඳින්වීම

### 1.1 පර්යේෂණයේ හැඳින්වීම හා විෂය ක්ෂේත්‍රය:

මෙය කින්නර ජනතාව පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයකි. කින්නර යනු ශ්‍රී ලංකාවේ වෙසෙන කුඩා ජන කොට්ඨාසයකි. සමාජ හා සංස්කෘතික මානව විද්‍යාවේ (Social and Cultural Anthropology) ඇති ප්‍රධාන අධ්‍යයන ක්ෂේත්‍රයක් වන මානව වංශ විද්‍යාව (Ethnology) මඟින් සහ භෞතික මානව විද්‍යාවේ (Physical Anthropology) එන ප්‍රධාන අධ්‍යයන ක්ෂේත්‍රයක් වන මානුෂ රූපාකෘති විද්‍යාව (Human Mophology) මඟින් කින්නරයන් පිළිබඳව අධ්‍යයනයක් මෙහිදී සිදුවේ.

මානව වංශ විද්‍යාව මඟින් සමකාලීන සංස්කෘතීන් පිළිබඳ තුලනාත්මක සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදුවෙයි (Barnouw, 1982: 5). දහ අට හා දහ නව වන සියවස්වල යුරෝපීය බලවත් රටවල ආධිපත්‍යයට නතුවූ යුරෝපීය නොවන ප්‍රදේශවල ජීවත් වන්නන්ගේ සිතුම් පැතුම් චර්යා රටා අවබෝධ කර ගැනීමට සමහර යුරෝපීය විද්වතුන් උත්සහ ගත්හ. ඒ මඟින් ලබාගත් දැනුම යටත් විජිත රාජ්‍ය පරිපාලන කටයුතු පහසු කර ගැනීම සඳහා යොදා ගත්හ. එබඳු අධ්‍යයන රාශියක් මානව වංශ විද්‍යාව යටතේද විෂය ක්ෂේත්‍රය ආරම්භයේ සිටම සිදු වන බව කිව යුතුය. එමෙන්ම මෙම විෂය ක්ෂේත්‍රය යටතේ 19 වන සියවස අග භාගයේ සිට මේ දක්වාම බටහිර බලපෑම් නිසා වෙනස් වෙමින් පවතින ප්‍රාථමික හා සාම්ප්‍රදායික සමාජ පිළිබඳ අධ්‍යයන සිදුවේ.

මේ සියවසේ ආරම්භයේ සිට එබඳු අධ්‍යයන සැලකියයුතු ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ ද සිදුවී ඇත. එහෙත් එම අධ්‍යයනයන්හි දී ස්වදේශීය මානව විද්‍යාඥයින්ගේ දායකත්වය එතරම් දුරට ලැබී නැත. එම අධ්‍යයන අතර මූලික තැනක් ගන්නා ඒවා විදේශ විද්වතුන් අතින් සිදු වී ඇත. කෙසේ වුවත් ලංකාවේ ප්‍රාථමික සමාජ පිළිබඳ ඔවුන් සිදුකළ අධ්‍යයන අද පවා විශේෂයෙන් කථාබහට ලක් වේ. සෘජුවම ප්‍රාථමික සමාජ ලෙස සැළකිය හැකි කුඩා කණ්ඩායම් දෙකක් ලංකාවේ ඇත. ඒවා නම් වැදි සහ අහිකුණ්ඨික ජන සමාජයි. මොවුනු ලාංකේය මහා සමාජයෙන් සමාජ හා සංස්කෘතික වශයෙන් වෙනස් ලක්ෂණ පිළිබිඹු කරමින් ජීවත් වෙති. එමෙන්ම සිංහල මහා සමාජය තුළම ජීවත් වෙමින් ප්‍රාථමික සමාජ ලක්ෂණ ලෙස මානව විද්‍යාඥයින් හඳුනා ගත් ලක්ෂණ පිළිබිඹු කරමින් ජීවත් වන කුඩා කණ්ඩායම් දෙකකි. ඒවා නම් රොඩී සහ කින්නර සමාජයි.

මේවායින් හඳුනාගත හැකි වූ ප්‍රාථමික සමාජ ලක්ෂණ නම්

අඩු ජනගහනයක් තිබීම

මුහුණට මුහුණලා සබඳතා පැවැත්වීම

ගැහිම්බර සබඳතා පැවැත්වීම

සාමාජීය පසුබිමේ සමානත්වය

ප්‍රාථමික අර්ථ ක්‍රමය යන ඒවායි.

මෙම ලක්ෂණ පිළිබිඹු කරන කින්නර ජනතාවගේ ජීවන රටාව මෙහිදී අධ්‍යයනයට ලක් කෙරෙයි. මානව විද්‍යාවේ එන සංකල්ප හා න්‍යායන් ගණනාවක් එම අධ්‍යයනය සඳහා යොදා ගැනෙයි. එමගින් කින්නර ජනතාව පිළිබඳව වඩාත් හොඳින් විග්‍රහ කිරීමට හැකිවනු ඇත.

කින්නර ජනතාව අතර පැවති හා පවතින සමාජ සංස්කෘතික තත්ත්වයට අමතරව ඔවුන්ගේ භෞතික, ශාරීරික තත්ත්වයන්ද මෙහිදී විමසුමට ලක් කෙරෙයි. ජන වර්ගයක් වශයෙන් කින්නර ජනතාව සහ අනෙකුත් සිංහල ගැමියන් අතර ඇති වෙනස් කම් මෙන්ම ජාතික හා කලාපීය වශයෙන් ජීවත් වන ජන කොටස් සමඟ සංසන්දනාත්මක අධ්‍යයනයක් මෙහිදී සිදුවේ. එමඟින් කින්නර ජනතාවගේ ශාරීරික අනන්‍යතාව අවබෝධකර ගැනීමට හැකිවනු ඇත.

## 1.2 පර්යේෂණයේ වැදගත්කම:

කාලයක් තිස්සේ මානව විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රාථමික හා ගැමි සමාජ පිළිබඳව අධ්‍යයන විශාල ප්‍රමාණයක් සිදුවී ඇත. වර්තමානයේ එම සමාජ විශාල වශයෙන් වෙනස් වී ඇති නිසා එම සමාජවල විකාශණය තේරුම් ගැනීමට නැවත නැවතත් අධ්‍යයනය කළ යුතුය. එබඳු අධ්‍යයනයන් සිදු කල සම්භාව්‍ය මානව විද්‍යාඥයින්ගේ අරමුණ කුමක් වුවත් මානව විද්‍යාව වර්තමානයේ හදාරන අයට ඒවා මහත් ආලෝකයක් වනු ඇත. එබඳු අධ්‍යයන සිදුකර අනාගත පරපුරට දායාද කිරීම අපගේ ද යුතු කමකි.

ශ්‍රී ලංකාව තුළ මානව විද්‍යා අධ්‍යයන ක්ෂේත්‍රය යටතේ අපට දැකිය හැක්කේ ඉතාමත් අඩු ශාස්ත්‍රීය පර්යේෂණ නිබන්ධ ප්‍රමාණයකි. බොහෝවිට සිදු වී ඇත්තේ යම් යම් කුඩා ජනකොටස් සහ සිංහල සමාජයේ කුල ක්‍රමය, එහි සමහර කුල, පිළිබඳ මූලික අධ්‍යයන කිපයක් පමණයි. නමුත් මානව වංශ වර්ග හෝ කුල ක්‍රමය පිළිබඳව එම ජන කණ්ඩායම්වල සුවිශේෂ ලක්ෂණ මුල් කර ගෙන පුළුල් ලෙස විචාරාත්මකව සිදු කරන අධ්‍යයන මානව විද්‍යා ඥාන කෝෂයට එකතු කිරීම බෙහෙවින් වැදගත් වනවා ඇත.

කින්නර යනු ක්‍රමයෙන් වෙනස් වෙමින්, මහා සමාජයට නතු වෙමින් පවතින කුඩා ජන කොටසකි. ඔවුන් පිළිබඳව මේ තාක් සිදුවී ඇති ප්‍රධානතම මානව වංශ විද්‍යාත්මක අධ්‍යයනය එම්.ඩී. රගවාන් (M. D. Raghavan) විසින් සිදුකර ඇත. 1951 දී එවකට ජාතික කෞතුකාගාරයේ මානව වංශ විද්‍යාඥයෙකු ලෙස සේවය කල ඔහු කින්නරයන් පිළිබඳ Spolia

Zelanica සඟරාවට ලිපියක් සපයා ඇත. ඊට අමතරව 1960 දශකය අග භාගයේ කින්නර ජනතාව ඇසුරින් ක්‍රියාත්මක වූ සර්වෝදය වැඩසටහනක් සමාලෝචනය කරමින් මහාචාර්ය නන්දසේන රත්නපාල විසින් ලියූ ලිපියද වැදගත් වේ. කෙසේ වුවත් කින්නර ජන සමාජය පිළිබඳව පුළුල් ලෙස විග්‍රහාත්මකව අධ්‍යයනයක් සිදු කිරීම කාලීනව වැදගත් වෙයි.

වර්තමානයේ ග්‍රාම සංවර්ධන සහ සුභ සාධන, පුනරුත්ථාපන වැඩසටහන් සැලසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී ව්‍යවහාරික මානව විද්‍යා දැනුම යොදා ගනු දැකිය හැකිය. කින්නර ජනතාවගේ සංවර්ධනය උදෙසා රජයේ හා රාජ්‍ය නොවන විවිධ ආයතන සංවිධාන මෙතෙක් විවිධ ක්‍රියා මාර්ග ගෙන ඇත. එහෙත් ඒවා සාර්ථකවූ බවක් පෙනෙන්නට නැත. මෙම පර්යේෂණයෙන් සොයා ගත් දෑ අදාල අංශ වලට ලබා දීම මඟින් එම කටයුතු වඩා ක්‍රමවත්ව කළ හැකිවනු ඇත.

### 1.3 අධ්‍යයනයේ අරමුණු :

මෙම පර්යේෂණය අරමුණු කිහිපයක් පාදක කර ගෙන සිදුකළ බව සඳහන් කල යුතුය. ඒවා මෙසේ සංක්ෂිප්තව ඉදිරිපත් කළ හැක.

1. කින්නර සමාජයේ ආරම්භය සහ විකාශණය පිළිබඳ භෞතික, සමාජ හා සංස්කෘතික වශයෙන් මානව විද්‍යාත්මක කරුණු එකතු කිරීම.
2. කින්නර ජන සමාජයේ සමාජ සංවිධානය, ආර්ථික ජීවිතය පිළිබඳ විමසීම.
3. කින්නර ජනතාව සම්බන්ධ ආගමික පසුබිම හා ඇදහිලි විශ්වාස තේරුම් ගැනීම.
4. ඔවුන්ගේ උපත, වැඩිවිය පැමිණීම, විවාහය සහ මරණය ආදි ද්වාර කර්ම අවස්ථාවලදී පවත්වන චාරිත්‍ර අවබෝධ කර ගැනීම.
5. කින්නර ජනකතා, ජනකවි, ජන ශාන්ති කර්ම, ජන වෙදකම අධ්‍යයනය කිරීම.
6. කින්නර සමාජය වර්තමාන ස්වරූපයට පත්වීමෙහිලා බාහිර බලපෑම් හේතු වී ඇති ආකාරය සහ සමාජ වෙනස්වීමට අනුවර්තනය වී ඇති ආකාරය සොයා බැලීම.
7. කින්නර ජන සමාජයේ සුරක්ෂිත බව සඳහා ගතයුතු ක්‍රියා මාර්ග අවබෝධකර ගැනීම හා ඒවා ඉදිරිපත් කිරීම.

### 1.4 පර්යේෂණයේ යොදාගත් මූලාශ්‍රය:

කින්නර ජනතාව සම්බන්ධයෙන් සිදුකළ මෙම අධ්‍යයනය බොහෝවිට ක්ෂේත්‍ර අධ්‍යයනයක් වන නිසා ලිඛිත නොවන මූලාශ්‍රයට මූලික ස්ථානයක් ලැබුණු බව කිව යුතුය. එහෙත් එමඟින් මෙම පර්යේෂණයට ලිඛිත මූලාශ්‍රයවල ඇති වැදගත්කම අවතක්සේරු කළ බවක් ඇඟවෙන්නේ නැත. කින්නර ජනතාවගේ සමාජ සංස්කෘතික ලක්ෂණ සියල්ලක්ම විග්‍රහ කිරීමට පෙර ඒ සඳහා ප්‍රවේශයක් වශයෙන් අදාල මානව විද්‍යාත්මක සංකල්ප හා න්‍යායන් හැදෑරූ බව සඳහන් කළ

යුතුය. ඒ සඳහා ලිඛිත මූලාශ්‍රය සැලකිය යුතු ප්‍රමාණයක් පරිශීලනය කිරීමට සිදුවිය. විශේෂයෙන් කින්නර ජනතාවගේ ආරම්භය හා විකාශණය පිළිබඳ විමසන විට වැඩි අවධානයක් යොමු වූයේ ලිඛිත මූලාශ්‍රය කෙරෙහිය. ලිඛිත මූලාශ්‍රය පරිශීලනය කිරීමේදී වඩාත් උනන්දු වූයේ හැකි තරම් මූලික හෙවත් ප්‍රාථමික මූලාශ්‍රය උපයෝගීකර ගැනීමටයි. කින්නර ජනතාවගේ ඓතිහාසික විකාශනය අවබෝධ කර ගැනීමෙහිලා ජන වංශය, බෝධි වංශය, මහා වංශය වැනි මූලික මූලාශ්‍රය පරිශීලනය කරන ලදි. මෙම ප්‍රාථමික මූලාශ්‍රයට අමතරව අවශ්‍ය අවස්ථාවලදී ද්විතීයික මූලාශ්‍රය යොදා ගන්නා ලදි. උදාහරණයක් වශයෙන් ඉහත සඳහන් මහා වංශය ආදී වූ ප්‍රාථමික මූලාශ්‍රය පදනම් කර ගෙන ලියැවුණු පතපොත උපයෝගීකර ගත් බව කිව යුතුය. මෙම පතපොත බොහෝවිට ඓතිහාසික දෘෂ්ටි කෝණයකින් ලියවුණු ඒවායි. එම නිසා එම මූලාශ්‍රයවලින් මෙම පර්යේෂණයට අදාළ මානව විද්‍යාත්මක තොරතුරු ඉතා පරිස්සමෙන් තෝරා බේරාගත යුතු විය.

මේ ආකාරයටම මානව විද්‍යාත්මක සංකල්ප හා න්‍යායන් හඳුනා ගැනීමට විදේශීය භාෂාවලින් ලියැවුණු ග්‍රන්ථ පරිශීලනය කළ යුතු විය. එහිදී ද කිසියම් මානව විද්‍යාඥයෙකු තම මත වාදයන් මුලින්ම ඉදිරිපත් කළ ප්‍රකාශණ මෙන්ම එම මුල් මූලාශ්‍රය පදනම් කර ගෙන ලියැවුණු පොත් සැලකිය යුතු ප්‍රමාණයක් පරිශීලනය කරන ලදි. විශේෂයෙන් ඉංග්‍රීසියට අමතරව ප්‍රංශ හෝ ජර්මන් ආදී වෙනත් යුරෝපීය භාෂාවකින් ලියවුණු මුල් කෘතීන් නොව ඒවා පදනම් කර ගෙන අනුවර්තන හා පරිවර්තන ලෙස ඉංග්‍රීසියට  නැගුණු පතපොත යොදා ගන්නට සිදුවිය. ඒ අනුව මානව විද්‍යාවේ නිර්දිෂ්ට ග්‍රන්ථ, ශබ්දකෝෂ, විශ්වකෝෂ, වෙනත් විෂයයන් යටතේ ලියැවුණු ග්‍රන්ථ අදාල පරිදි යොදා ගත් බව කිව යුතුය.

ලිඛිත නොවන මූලාශ්‍රය වශයෙන් හඳුන්වන්නේ සමාජය සහ මිනිසුන්ය. කිසියම් පර්යේෂණයකදී ග්‍රන්ථාරූඪ මූලාශ්‍රය උපයෝගි කර ගන්නේ නැති අවස්ථාවකදී ලිඛිත නොවන මූලාශ්‍රය යොදා ගත යුතුය. මෙම පර්යේෂණය ඉලක්ක වන්නේ මහා සමාජයෙන් එක්තරා දුරකට ඈත්වී සිටි ජන කොටසක් කෙරෙහිය. එමෙන්ම එම අදාළ ක්ෂේත්‍රයේ ජනතාව අතර සමාජ හා සංස්කෘතික සමානකමක් තවමත් පවතියි. එම නිසා මූලාශ්‍රය යොදා ගැනීම අපහසු නොවේ. ලිඛිත නොවන මූලාශ්‍රය වශයෙන් මිනිසුන් යොදා ගැනීමේදී පැරණි කලාල කර්මාන්තය හොඳින් ප්‍රගුණ කළ වැඩිහිටියන්, ගම් ප්‍රධානීන් සහ වගකිව යුත්තන් ලෙස පෙනී සිටි අය මෙන්ම ග්‍රාම සේවා නිලධාරී වැනි බාහිරින් සම්බන්ධ වී සිටින්නන් කෙරෙහි මූලික අවධානයක් යොමුවිය. එමෙන්ම සම්ප්‍රදායෙන් බැහැර වන්නට උත්සහ කරන්නන්, ජීවත්වන ප්‍රදේශයෙන් පරිබාහිර රැකියා සඳහා යොස් සිටින්නන් මූලාශ්‍රය වූහ.

## 1.5 පර්යේෂණයේදී යොදාගත් ක්‍රම වේදය:

විද්‍යාත්මක ක්‍රමය උපයෝගී කරගෙන අධ්‍යයනය කළ යුක්කේ භෞතික, ජීව විද්‍යාත්මක, ස්වාභාවික තත්ත්වයන් පමණක් යැයි කලක සිට මතයක් පැවතුණි. එහෙත් අදින් සියවස් එකහමාරක පමණ කාලයක සිට විද්‍යාත්මක ක්‍රමය සමාජය තුළ ජීවත්වන මිනිසුන්ගේ හැසිරීම් රටා අවබෝධ කර ගැනීම සඳහා ද විෂය ක්ෂේත්‍ර ගණනාවකම සාර්ථකව යොදා ගැණින. එසේ විද්‍යාත්මක ක්‍රමය (පරික්ෂණය - නිරික්ෂණය - නිගමනය) සමාජය අධ්‍යයනය කරන්නට සාර්ථකව යොදාගත් එම විෂය ක්ෂේත්‍ර පොදුවේ සමාජීය විද්‍යා ලෙස හඳුන්වයි. ඒ අතුරින් මානව විද්‍යාව, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව යන ඒවා ප්‍රධාන තැනක් ගනියි. මානව විද්‍යාවේ ප්‍රධාන උප විෂයක් වන භෞතික මානව විද්‍යාව ඍජුවම ස්වාභාවික තත්ත්වයන් මත පර්යේෂණ සිදු කරන නිසා විද්‍යාත්මක ක්‍රම භාවිතයේ විශේෂත්වයක් නැත. එමගින් මිනිසාගේ ජීව විද්‍යාත්මක ස්වභාවය හා විකාශණයවූ ආකාරය පිළිබඳව අධ්‍යයනය කරයි. මානව විද්‍යාවේ අනෙක් ප්‍රධාන විෂය ක්ෂේත්‍රය වන සමාජ හා සංස්කෘතික මානව විද්‍යාව අද ඉතා සාර්ථකව විද්‍යාත්මක ක්‍රම උපයෝගී කර ගෙන මිනිසාගේ සමාජ හැසිරීම් රටා පිළිබඳ අධ්‍යයනය කරනු දක්නට ලැබෙයි. විද්‍යාත්මකව යමක් අධ්‍යයනය කරනවා යැයි කියන්නේ ඒ පිළිබඳ ඇත්ත ඇති සැටියෙන් තේරුම් ගැනීමක් මෙන්ම සොයා දැන ගැනීමකි. මෙම පර්යේෂණයේදී ඉහත දක්වා ඇති මූලාශ්‍රය උපයෝගී කර ගෙන මෙහි පසුව විස්තර කරණ නියැදිය තුළ විද්‍යාත්මක ක්‍රම භාවිතයෙන් අවශ්‍ය දත්ත රැස්කිරීම හා ඒවා විග්‍රහ කිරීම සිදුවන බව කිව යුතුය.

සමාජ හා සංස්කෘතික මානව විද්‍යාව ආරම්භයේදී ඒ ඒ විද්වතුන් නොයෙක් ක්‍රම උපයෝගී කර ගෙන තම අධ්‍යයන වලදී දත්ත රැස්කළ බව අප දන්නා කරුණකි. එහෙත් සමහර විට එම දත්ත රැස්කළ ක්‍රමයන්හි විද්‍යාත්මක බව පිළිබඳ යැක ඇති වේ. එම නිසා අදාළ අධ්‍යයන කෘතින් මගින් ඉදිරිපත් කළ කරුණු පිළිබඳ ගැටලු ඇති වේ. එහෙත් පසු කාලීනව පවත්නා තත්ත්වය ඒ ආකාරයෙන්ම අවබෝධ කර ගත හැකි ආකාරයේ උපක්‍රම භාවිත කිරීම නිසා එම පර්යේෂණ ප්‍රතිඵල වලට පිළිගත හැකි බවක් ඇති විය. එමෙන්ම ඒවා ජනප්‍රිය විය. උදාහරණයක් වශයෙන් බී. මැලිනොවුස්කි ( B.Malinowski ) නම් බ්‍රිතාන්‍ය ජාතික මානව විද්‍යාඥයා ට්‍රොබ්‍රියන්ඩ් (Trobriand) දූපත්වල සිදුකළ පර්යේෂණ දැක්විය යැක. මෙම පර්යේෂණ නිබන්ධයේදී මානව විද්‍යාඥයින් මෙතෙක් යොදා ගෙන ඇති සාර්ථක ක්‍රමවේද අනුගමණය කළේය.

විවිධ ක්ෂේත්‍ර යටතේ ලියවී ඇති පතපොත පරිශීලනයෙන් මානව විද්‍යාත්මක වැදගත් කමක් ඇති අදාළ කරුණු තෝරා බේරා ගැනීමට අමතරව ලිඛිත නොවන මූලාශ්‍රය පරිශීලනයේදී කිත්තර සමාජයේ සුවිශේෂීයත්වය මත ක්‍රම වේද තෝරා ගතයුතු විය. කිත්තර ගැමියන් අනෙකුත් සාමාන්‍ය සිංහල ගැමියන් සමඟ සංසන්දනාත්මකව බලන විට විශේෂ ලක්ෂණ කිහිපයක් හඳුනා ගත හැකිවිය. එනම් සමාජීය වශයෙන් පහත් කොටසක් ලෙස ඔවුන් විසින්ම

සැලකීම, බාහිරින් පැමිණෙන්නන් දෙස සැකමුසුව බැලීම, පාසැල් අධ්‍යාපනයක් නොලැබීම , බාහිර සම්බන්ධතා අඩුවීම සහ ලෝක දෘෂ්ඨියේ ඇති සීමා සහ මොවුන් තුළ දැකිය හැක. විශේෂයෙන් බාහිර පුද්ගලයින් දෙස සැකමුසුව බැලීමට හේතු වී ඇත්තේ වරින් වර කින්නර ගම්මාන වලට පැමිණි වාර්තා කරුවන්ගේ ක්‍රියා කලාපයි. අධ්‍යයන පර්යේෂණ පවත්වන හෝ ආධාර ලබාදීමේ මුවාවෙන් කරුණු එක්රැස් කරගෙන ගොස් පුවත්පත් ලිපි පළ කිරීම නිසා වර්තමාන කින්නර තරුණ පරපුර මහත් අපහසුතාවකට පත්ව ඇත. ඒ අනුව කින්නරයන්ගේ සම්ප්‍රදායික තොරතුරු ලෙහෙසියෙන් හෙළිදරව් නොකරන තත්වයක් 1995 මා මුලින්ම කින්නර ගම්මාන වලට යන විට තිබූ බව කිව යුතුය.

මුලින්ම කිවයුතු වන්නේ විධිමත් ප්‍රශ්නාවලියක් මගින් තොරතුරු රැස් කිරීම මෙබඳු පර්යේෂණයකදී කිසිසේත් කළ නොහැකි බවයි. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ උපලේඛණයක් යොදා ගෙන සම්මුඛ සාකච්ඡා පැවැත්වීමද සාර්ථක නොවේ. කින්නර ජනතාව පිළිබඳ පර්යේෂණය ආරම්භ කිරීමට ප්‍රථමයෙන් එබඳු කුඩා ජන කණ්ඩායම් ඇසුරින් මා සිදුකර තිබූ පර්යේෂණ වලින් ලැබූ අත්දැකීම් මෙහිදී බොහෝවිට උපකාර වූ බව සඳහන් කළ යුතුය. ඒ අනුව මෙම පර්යේෂණයේදී දත්ත රැස්කිරීමේ ක්‍රම ලෙස ප්‍රධාන වශයෙන් උපයෝගී කර ගන්නේ නිරීක්ෂණය සහ සහභාගිත්ව නිරීක්ෂණයයි (observation and participation observation). මෙම දත්ත රැස්කිරීමේ ක්‍රම උපයෝගී කර ගැනීමේදී තවත් උපකාරක සහ උපක්‍රම කිහිපයක් ද භාවිත කළේය. මෙහිදී උපක්‍රම වශයෙන් අදහස් කළේ ජනතාව වෙත සමීපවීම සඳහා යොදාගත් උපක්‍රමයි. උපකාරක යනු පර්යේෂණය සඳහා යොදාගත් සහායක උපකරණයි.

ක්ෂේත්‍ර පර්යේෂණය සඳහා මෙතෙක් පතපොතින් ඉතා සුළු වශයෙන් දැනගෙන තිබූ ගම්මාන දෙකකට යාමට සිදුවිය. මුල්ම ගමන්වලදී හැඟිගිය කරුණක් නම් අදාල ක්ෂේත්‍රයේ මිනිසුන් සමග සමීප නොවී කිසිදු පර්යේෂණ අරමුණක් සපුරාගත නොහැකි බවයි. ඒ අනුව මුලින්ම සිදුකළ කාර්යය නම් ගම්මානයේ මිනිසුන් සමග සුහදතාවක් ඇති කර ගැනීමයි. සමාජීය පර්යේෂණවල නිරත වන්නන් හමුදාව, පොලීසිය, රජයේ නිළධාරීන්, ග්‍රාම නිළධාරීන් තොරතුරු රැස්කරණ ආකාරයට කටයුතු කිරීම උචිත නොවේ. එය අණ කිරීමකින්, බලෙන් ලබා ගන්නා එකඟතාවකි. සමාජ පර්යේෂකයා තම ප්‍රතිග්‍රාහකයින්ගේ සුහදතාව මත යැපෙන්නෙකි. එය ගොඩ නගා ගන්නේ ලෙන්ගතුකම (රැපෝව - rapport) ඇති කර ගැනීමෙනි. වරින් වර ක්ෂේත්‍රයට යන විට නැවත නැවතත් එහි යාමට සහ දින ගණන් ගත කිරීමට හැකිවන පරිදි හොඳනිත වර්ධනය වන ආකාරයෙන් කටයුතු කිරීම අනිවාර්ය වේ. ඒ සඳහා තම බොහෝ අවශ්‍යතා මෙන්ම අවස්ථා කැපකළ යුතුවෙයි. පුද්ගල හැඟීම් යටපත් කර ගෙන ඉවසීම වර්ධනය කරගෙන හැසිරීම මගින් එම තත්ත්වය ඇතිකර ගත හැකිය. ඒ අනුව ක්‍රියා කිරීමෙන් පර්යේෂණය සඳහා තෝරාගත් කින්නර ගම්මාන දෙක වඩාත් හුරුපුරුදු තැන් බවට පත් විය.

මෙහිදී එම තත්වය මා ලැබූ උපරිම සාර්ථකත්වයක් ලෙස සඳහන් කළ යුතුය.

සාමාන්‍යයෙන් පර්යේෂණ පරමාර්ථ දත්ත දායකයාට හෙළි කළයුතු යැයි ආචාර ධර්මයක් පර්යේෂණ ක්ෂේත්‍රයේ ඇත. පර්යේෂණයේ නියම තත්ත්වය සියලු දෙනාට දැන්වීම එතරම් සුදුසු නොවේ. පර්යේෂණය දිගටම කරගෙන යාමට නම් ඔවුන් අකමැති දේ මා අතින් සිදු නොවිය යුතු විය. එම නිසා මුලින්ම කළ කාර්යය නම් කින්නර ගැමියන් අකමැති මොනවාද යන්න සොයා ගැනීමයි. ඒ අනුව ඔවුන් කුලය පිළිබඳ කථා කරන්නට අකමැති බව හැඟී ගියේය. අනිකුත් කුල සහ ඔවුන් අතර සබඳතාව, ඔවුන්ට ඇති සමාජ සීමා පිළිබඳව කථාකිරීමට අකමැතිය. ඒ පිළිබඳ තොරතුරු විමසීම නොරුස්නා දෙයකි. පර්යේෂණය සඳහා අවශ්‍ය එම තොරතුරු ඔවුන්ගෙන් නොවිමසා අවස්ථාවට උචිත උපක්‍රම මගින් ඔවුන්ගෙන්ම කියැවෙන්නට සැලැස්වීම මා යොදා ගත් එක් උපක්‍රමයකි. පර්යේෂණය සඳහා කින්නර ජනතාව අතරට ගියේ වෙස් වලාගෙන නොවේ. පර්යේෂකයකු ලෙසටමයි. කින්නර ජනතාවගේ සියලුම සමාජ සංස්කෘතික තත්ත්වයන් අධ්‍යයනය කරන බවක් මා ඇඟවූයේ නැත. ඔවුන්ගේ කර්මාන්තය කෙරෙහි මාගේ විශේෂ අවධානය යොමුවන බව ඇඟවුවේය. කලාල කර්මාන්තයේ සාම්ප්‍රදායිකත්ව ය හා අද එය වෙනස් වී ඇති ආකාරය අධ්‍යයනය කරන බවක් නිතර සඳහන් කරන ලදී.

තවදුරටත් කින්නර ජනතාවට සමීපවීම සඳහා යොදාගත් උපක්‍රමයක් නම් ඔවුන්ගේ කර්මාන්තය සිදුවන ආකාරය පෙන්වීමට විශ්වවිද්‍යාලයේ මානව විද්‍යාව හදාරණ සිසුන් ක්ෂේත්‍ර චාරිකා සඳහා කින්නර ගම්මාන වලට කැඳවාගෙන යාමයි. සමහර විට එය ඉතා අවදානම් සහිත කාර්යයක් වීමට ඉඩ තිබුනි. එහෙත් එය සාර්ථක වීම මගේ පර්යේෂණයට විශාල පිටුවහලක් විය. ගමට ප්‍රවේශවීමට කලින් සිසුන්ට නියමිත පරිදි උපදෙස් දීම නිසා අවදානමක් සිදුවූයේ නැත. කිසිදු ලෙසකින් කින්නර කුලය පිළිබඳ ප්‍රශ්න නොකරන ලෙස ඔවුන්ට අවධාරනය කරන ලදී. මෙම චාරිකා කින්නර ගැමියන්ගේ නිෂ්පාදන අලෙවි කරගැනීම සඳහා හොඳ අවස්ථාවක් ද විය. එමගින් කින්නර ගැමියෝ තවදුරටත් විවෘතව මා සමඟ කථාකිරීමට පෙළඹුනි. කෙසේ වුවත් සමස්ත කින්නර ජීවන රටාව පිළිබඳ තොරතුරු රැස්කළේ වක්‍රාකාරයෙනි. බොහෝ කරුණු ඔවුන් ප්‍රකාශ කරන තුරුම සිටින්නට සිදුවිය. එමෙන්ම කරුණක් දැනගැනීමට පුද්ගලයෙක් හමුවට කිහිප වතාවක් යන්නට සිදුවිය. සමහරවිට කින්නර ගැමියන් දෙතුන් දෙනෙකු සමඟ අවිධිමත් ලෙස සැහෙන වෙලාවක් කතාබහේ නිරත වී සිටින විට මා දින ගණනක් මහන්සි වී සොයාගත නොහැකි වූ කරුණු දැනගත හැකිවිය.

ක්ෂේත්‍ර පර්යේෂණයක් සාර්ථනව කරගෙනයාම සඳහා පර්යේෂකයා ප්‍රතිග්‍රාහකයින්ගේ සමාජ සංස්කෘතික පසුබිම හොඳින් දැනගත යුතුය. එමෙන්ම ඔවුන්ගේ අවශ්‍යතා මොනවාද යන්න

තේරුම් ගත යුතුය. හේනාවල මෙන්ම මල්හැව කින්නර ගැමියන් මුහුණ දෙන ඉතාම තදබල ප්‍රශ්නයක් නම් මත්පැන් වලට ඇබ්බැහිවීම යි. මත්පැන් හා මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ මා ලබා තිබූ පළපුරුද්ද උපයෝගී කරගෙන ගමේ සමිති සමාගම්වලට එක් රැස් වන අවස්ථාවලදී ඒ පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම් කරන ලදී. මෙම දැනුවත් කිරීම් ඔවුන්ගේ පැත්තෙන් ප්‍රයෝජනවත් වූ අතර පර්යේෂණය හොඳින් කරගෙන යාමට ද පිටුවහලක් විය. මේ ආකාරයෙන් ගමට ප්‍රවේශවීම මඟින් සාර්ථකව ගම නිරීක්ෂණය කළහැකි විය. බී. මැලිනොව්ස්කි නම් මානව විද්‍යාඥයා ඔහු ක්ෂේත්‍ර අධ්‍යයන වලදී ලැබූ අත්දැකීම් මෙසේ විස්තර කරයි. "සාර්ථක ක්ෂේත්‍ර පර්යේෂකයකු තුළ ඇතිකර ගත යුතු ඉතාමත් අවශ්‍යම දේ නම් දත්ත දායකයින්ගේ එදිනෙදා කටයුතු වලට උනන්දු වී ඔවුන්ගේම කෙනෙකු බවට පත්වීමයි" (Malinowski, 1961: 7-8).

පර්යේෂකයකුට ඔවුන්ගේ අවශ්‍යතා සපුරා ගැනීමට යොදා ගතහැකි ප්‍රබලම ආයුධය නම් නිරීක්ෂණයයි (Rathnapala, 1986: 71). හොඳින් නිරීක්ෂණයේ යෙදීමට එය සහභාගී වී නිරීක්ෂණයක් කරගත යුතුය. ඒ සඳහා හොඳින් ක්ෂේත්‍රයට ප්‍රවේශවීම මෙන්ම විශ්වාසය දිනාගැනනීමද අත්‍යවශ්‍ය වේ. කීර්තිමත් සමාජ පර්යේෂකයකු වන මහාචාර්ය නන්දසේන රත්නපාල වරක් ප්‍රකාශ කළ ආකාරයට ලෙන්ගතු කම ගොඩනගා ගැනීමට සාපේක්ෂව එය දිගටම පවත්වාගෙන යාම අපහසු විය හැකියි. සාර්ථක ක්ෂේත්‍ර පර්යේෂකයකුට එය කළ හැක්යි (රත්නපාල, 1987: 69). පර්යේෂකයා පර්යේෂකයකු ලෙසම ගමට ප්‍රවේශ වුවත් ගමට අමුත්තකු ලෙස හැසිරීම එතරම් උචිත නොවේ. එම ක්ෂේත්‍රය පිළිබඳ හොඳින් දන්නා අයකු ලෙස කටයුතු කිරීමට හැකි විය යුතුය. පර්යේෂකයාට එය අමුතු දෙයක් වන්නට ඉඩක් නැත. එයට හේතුව පර්යේෂකයා ද අපරාධකරුවන්, ලේඛකයන්, කවියන් මෙන්ම තමන් පෝෂණය කළ සමාජ , සංස්කෘතික පරිසරයෙහිම ප්‍රතිඵලයක් වීමයි. එම නිසා තමන් සමාජ ඉගෙනුමෙන් ලබා ගත් අත්දැකීම පර්යේෂණයේදී හොඳින් යොදා ගැනීමට හැකිවිය යුතුය. එනම් එයින් ඇඟවෙන්නේ තමන්ට අවශ්‍ය දැනුම සහ අත්දැකීම තමන් ජීවත් වන සමාජය තුළින්ම ලබාගත යුතු බවයි.

නිරීක්ෂණය, සහභාගිවී නිරීක්ෂණය මගින් දත්ත රැස්කිරීමේදී විධිමත් ලෙස එම අවස්ථාවේදී ම දත්ත සටහන් කර ගැනීමක් කළ නොහැකිය. එම නිසා ඉහත සඳහන් කළාක් මෙන් යම් යම් උපකරණ භාවිත කරන්නට සිදුවිය. මෙම පර්යේෂණයේදී ප්‍රධාන වශයෙන් දත්ත දායකයින්ට නොහැඟෙන සේ ඔවුන් සමඟ සිදුවූ අවිධිමත් සාකච්ඡා පටිගත කරන ලදී. එහිදී ඉතා කුඩා කැසට් රෙකෝඩරයක් භාවිත කරන ලදී. මෙය එක් ආකාරයකින් දත්ත දායකයා රැවටීමක් ලෙස කෙනෙකුට තර්ක කළ හැකිය. එහෙත් බොහෝ ක්ෂේත්‍ර පර්යේෂණ වඩාත් සාර්ථක කරගැනීම සඳහා මෙබඳු උපක්‍රම යොදා ගැනීම සාමාන්‍ය දෙයකි. කෙසේ වුවත් මෙසේ